# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

(Recovery Plan for Learning Loss – 2022)

(7 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13 ක් ද දෙවන හා තෙවන වාර වල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නර්තනය

## 7 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| දෙවන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **අත්‍යවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගයන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1<br>නිර්දේශිත ගායනා වල සමාජයීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • නියමිත ගායනා වල සමාජයීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.<br>• එම ගායනා වල භාෂාමය ලක්ෂණ හා සාහිත්‍යමය වටිනාකම් අගය කරයි.<br>• ගායනය හා බැඳි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• අදාළ ගායනා වල වටිනාකම් අගයමින් කරුණු සාකච්ඡා කරයි. | • කුළු, තාලම්, ගායනා වල සංස්කෘතික පසුබිම | 4.1<br>ජන ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු. | 02 |
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගයන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2<br>නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි. | • එක් එක් ගායනාවල අනන්‍යතා ලක්ෂණ හඳුන්වයි.<br>• නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.<br>• ගයන ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේ දී සරල චලන භාවිතයට ගනියි.<br>• කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමෙන් සතුටක් ලබයි. | • කුළු, තාලම් කවි නිවැරදි නාදමාලාව අනුව ගායනය<br>• සරල චලන භාවිත කරමින් ගායනය | 4.2<br>ජන ගී ගායන ඉදිරිපත් කරමු. | 02 |
| 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | 3.2<br>විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි. | • විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කිරීමේ විධි ක්‍රම විස්තර කරයි.<br>• ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැස්කර ගනියි.<br>• ශබ්ද හා නාද නිපදවීමට හැකි වන පරිදි විකල්ප වාද්‍ය උපකරණ සකස් කරයි.<br>• කණ්ඩායමක් ලෙස සාමූහිකව කටයුතු කරයි. | • විකල්ප වාද්‍ය උපකරණ තාල වාද්‍ය භාණ්ඩ සුසිර වාද්‍ය භාණ්ඩ<br>• වාද්‍ය භාණ්ඩ නිර්මාණය පිළිබඳ හැඳින්වීම. | 3.2<br>විකල්ප වාද්‍ය උපකරණ සකස් කරමු. | 02 |
| 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර | 1.3<br>ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් | • කුළු/ තාලම් නැටුමෙහි ලක්ෂණ විස්තර කරයි.<br>• කුළු/ තාලම් නැටුමට උචිත සරල පද(මාත්‍රා) නිර්මාණය කරයි. | • කුළු/ තාලම් නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ<br>• කුළු/ තාලම් නැටුම<br>• නිර්මාණය | 1.3<br>කුළු/ තාලම් නැටුම නිර්මාණයට එක් වෙමු. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ගනිමින් නර්තන නිර්මාණ කරයි. | නර්තන නිර්මාණය කරයි. | • රංග උපකරණ නිසි ලෙස හසුරවමින් නර්තනය කරයි.<br>• කණ්ඩායම් හැඟීමෙන් යුතුව සාමූහිකව නර්තනයේ යෙදෙයි.<br>• නිමාවක් ඇති කුළු/ තාලම් නැටුමක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරයි. | | | |
| 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | 3.2<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • දවුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• එය භාවිත වන අවස්ථා නම් කරයි.<br>• එහි පරිමිතිය හා සැකස්ම පිළිබඳ අදහස් දක්වයි.<br>• දවුල සැකසීමට ගන්නා අමුද්‍රව්‍ය නම් කරයි.<br>• දවුල් වාදනය හා සම්බන්ධතොරතුරු ඉදිරිපත් කරයි. | • දවුල වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු<br>• භාවිත අවස්ථා<br>• සැකැස්ම හා පරිමිතිය<br>• රූප සටහනක් ඇද කොටස් නම් කිරීම. | 3.1<br>දවුල පිළිබඳ තොරතුරු විමසමු. | 02 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5.2<br>නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • බෙර වාදනයට අනුව නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් අදාළ වන්නමේ කවි ගායනය කරයි.<br>• නියමිත තාල රූපයට අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කරයි.<br>• තුරඟා වන්නම/ භාවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම තාල තබා කියයි.<br>• තුරඟා වන්නම/ භාවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි. | • සුළු මැදුම් දෙතිතට අයත් තුරඟා වන්නම/ භාවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නම සම්පූර්ණයෙන් නැටීම. | 2.5.2<br>වන්නම් ගයමින් නටමු. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • සාමූහිකව හා ඒකලව අභ්‍යාසයේ යෙදෙමින් කුසලතා වර්ධනය කරගනියි. | | | |
| 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.1<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි සාරධර්ම අනුගමනය කරයි. | • ඉගෙනුම ලබන නර්තන සම්ප්‍රදාය හා සබැඳි චාරිත්‍ර විධි හා වත් පිළිවෙත් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>• ඒ හා සබැඳි සාරධර්මවල වැදගත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සාරධර්ම රැක ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | • කළඑළි මංගල්‍යය/ හිස වෙස් පැළඳීම/ මඩු බැසීම/ ගුරු වරම් දීමට අදාළ චාරිත්‍ර විධි | 5.1<br>ශිල්පීය ප්‍රාගුණ්‍ය එළි දක්වන අවස්ථා ඉදිරිපත් කරමු. | 02 |
| 6.0<br>රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශ්ෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.4<br>විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | • රාමසාන් උත්සව පැවැත්වීමට හේතු විස්තර කරයි.<br>• රාමසාන් උත්සවය හා සබැඳි සංස්කෘතික ලක්ෂණ සාකච්ඡා කරයි.<br>• එම උත්සවය හා බැඳි කලාත්මක අංග අගය කරයි.<br>• විවිධ ජන වාර්ගික උත්සව අධ්‍යයනය කිරීමෙන් ජාතික සමගිය වර්ධනය කර ගනියි. | • රාමලාන් උත්සවය<br>• සංස්කෘතික ලක්ෂණ<br>• කලාත්මක අංග<br>• පැවැත්වීමේ හේතු<br>• ජාතික සමගිය පිළිබඳ අදහස් | 6.4<br>විවිධ ජන වර්ග හා සැබැඳි සංස්කෘතික උත්සව අගයමු. | 02 |
| | | | | **දෙවන වාරය කාලච්ඡේද එකතුව** | 18 |